# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 99 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 20/01/2024<br>පැය 1135 |

**මාධ්‍ය නිවේදනය**

**කැලණිය රජමහා විහාරස්ථානයේ දුරුතු මහා පෙරහර හේතුවෙන් රථ වාහන ගමනාගමනය සීමා කිරීම - කැලණිය පොලිස් වසම.**

2024 වර්ෂයේ කැලණිය රජමහා විහාරස්ථානයේ දුරුතු මහා පෙරහර 2024.01.24 වන දින රාත්‍රී 8.00 සිට 2024.01.25 වන දින අළුයම 3.00 දක්වා වීථි සංචාරය කිරීමට නියමිත අතර, පෙරහරට සමගාමීව පැවැත්වෙන දේවදූත පෙරහර 2024.01.21 වන දින සවස 3.00 සිට රාත්‍රී 8.00 දක්වා වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

2024.01.21 වන දින දේවදූත පෙරහර කැලණි විහාරස්ථානයෙන් ආරම්භ වී පැලියගොඩ මාර්ගයේ පිලපිටිය හන්දිය දක්වා ගමන් කර ගෝනගම්පල මාර්ගයෙන් වරාගොඩ මාර්ගයට අවතීර්ණ වී, වරාගොඩ මාර්ගයෙන් නුංගංගොඩ දක්වා ගමන් කර ගල් බොරැල්ල, වලංකඩ හන්දියෙන් දකුණට හැරී විහාර මාවත ඔස්සේ කැලණිය විහාරස්ථානයේ නවලෝක වාහල්කඩින් විහාරස්ථානට ගෙවැදීමට නියමිතව ඇත.

2024.01.24 වන දින දුරුතු මහා පෙරහර විහාරස්ථානයෙන් ආරම්භ වී කැලණිසිරි වටරවුමෙන් බියගම මාර්ගය ඔස්සේ ගමන් කර විහාර මාවත, වලංකඩ හන්දියෙන් දකුණට හැරී බස් නැවතුම අසලින් බියගම මාර්ගයට පැමිණ බියගම මාර්ගයේ වාහල්කඩින් විහාරස්ථානයට ගෙවැදීමට නියමිතව ඇත.

ඒ අනුව ඉහත කාල සීමාව තුල එම මාර්ගයන් භාවිතා කිරීමට අපේක්ෂිත රියදුරන්ට හා මහජනතාවට පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට පොලිසිය ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග:-**

- බියගම හා දෙල්ගොඩ දෙසට ගමන් කරන රථවාහන පෑලියගොඩ, කිරිබත්ගොඩ හරහා සපුගස්කන්ද ඔස්සේ බියගම හා දෙල්ගොඩ දෙසට ගමන් කළ හැක.

- බියගම හා දෙල්ගොඩ දෙස සිට කොළඹ දෙසට ගමන් කරන රථවාහන සපුගස්කන්ද, කිරිබත්ගොඩ, පෑලියගොඩ හරහා කොළඹ දෙසට ගමන් කළ හැක.

- පෑලියගොඩ දෙස සිට කැලණිය හරහා වැල්ලම්පිටිය, කැලණිමුල්ල, මුල්ලේරියාව හා කඩුවෙල දෙසට ගමන් කරන රථවාහන බේස්ලයින් මාර්ගය ඔස්සේ ඔරුගොඩවත්ත හන්දියෙන් වමට හැරී අවිස්සාවේල්ල මාර්ගයට පැමිණ වැල්ලම්පිටිය, අඹතලේ හා කඩුවෙල දෙසට ගමන් කළ හැක.

- කඩුවෙල, වැල්ලම්පිටිය, කැලණිමුල්ල හා මුල්ලේරියාව දෙස සිට කැලණිය හරහා පෑලියගොඩ දෙස සිට ගමන් කරන රථවාහන අවිස්සාවේල්ල මාර්ගය ඔස්සේ ඔරුගොඩවත්ත හන්දියෙන් දකුණට හැරී බේස්ලයින් මාර්ගය ඔස්සේ පෑලියගොඩ දෙසට ගමන් කළ හැක.